**ශීර්ෂය 257 - කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය - 257 කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා , පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 මැයි 26 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම.**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

--------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 916.40 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 912.20 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4.20 ක් හෙවත් සියයට 0.46 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | |
| පුනරාවර්තන | 796.20 | 795.59 | 0.61 | 0.07 |
| මූලධන | 120.20 | 116.61 | 3.59 | 2.99 |
| **එකතුව** | **916.40** | **912.20** | **4.20** | **0.46** |

(ආ) **වෙනත් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යංශ 29 ක් හා දෙපාර්තමේන්තු 15 ක් විසින් එකතුව රු.මිලියන 3,446 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3,306 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු. මිලියන 140 ක් හෙවත් සියයට 4 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 25701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 60.76 | 55.88 | 46.76 | 56.68 | 265.00 | 196.41 |

## 2.3 අග්‍රිම ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.මිලියන 108.29 ක් වී තිබුණි.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ තැන්පත් ගිණුම් 07 ක 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 368.62 ක් විය. විස්තර පහත දැක්වේ.

| පොදු තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0059/000 | 0.17 |
| 6000/0000/00/0002/0077/000 | 0.40 |
| 6000/0000/00/0016/0030/000 | 218.32 |
| 6000/0000/00/0017/0008/000 | 40.05 |
| 6000/0000/00/0018/0037/000 | 94.78 |
| 6000/0000/00/0019/0006/000 | 14.79 |
| 6003/0000/00/0033/0000/000 | 0.09 |
| **එකතුව** | **368.60** |

## 2.5 විගණන නිරීක්ෂණය

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වූ සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/ 2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. |
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පිළියෙළ කර නොතිබුණි. |

### 3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 25701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.196,410,844 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂවලින් රු.342,164 ක් වර්ෂ 1 සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

**3.3 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය**

**3.3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් වර්ෂය අවසානවී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වූවත්, එම වාර්තාව 2016 ජුනි 22 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

වෙනත් අමාත්‍යාංශවලින් ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කර ඉදිකරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු ගොඩනැගිලිවල වටිනාකම ගණනය කර ස්ථාවර වත්කම් ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු සියළුම වාහන සම්බන්ධයෙන් සමීක්ෂණයක් කර ඒවා ස්ථාවර වත්කම් ලේඛනවල ඇතුළත් කර නොතිබුණි.

**3.5 අනුකූල නොවීම්**

**නිතී රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නිති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිති රීති රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
| --- | --- | --- |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | මුදල් රෙගුලාසි 880 හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ 1993 ඔක්තෝබර් 07 දිනැති ඊ/2/ඇප ලිපිය | භාණ්ඩ හා මුදල් භාරව කටයුතු කරන නිලධාරින් හා චෙක්පත් අත්සන් කරන ප්‍රාදේශීය ලේකම් කාරයාල 14 ට අයත් නිලධාරින් ගෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| **(ආ)** | **විශ්‍රාම වැටුප් චක්‍රලේඛ** | |
| | 2009 ජනවාරි 07 දිනැති අංක 1/2009 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | වයස්ගත වීම මත සිදුවන රෝගාබාධ සඳහා ගෙවීම් කළ නොහැකි වුවද, මිල්ලනිය හා බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එවැනි රෝග තිබෙන විශ්‍රාමිකයන් 4 දෙනෙකු සඳහා ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි. |

**3.6 දේශීය මූලාකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**------------------------------------------------------------**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණ වලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

**-------------------------------**

**පහත සඳහන් ප්‍රමාදයන් සිදු වී තිබුණි.**

(i) 2014 වර්ෂයේදී දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කළ එකතුව රු.223,350,271 ක් වූ ව්‍යාපෘති 43 ක කාර්යයන් 2015 දෙසැම්බර් 31 දින වන විට නිමකල යුතු වුවත්, 2016 මාර්තු මාසය අවසාන වන විටත් නිමවී නොතිබුණ අතර ඒ වෙනුවෙන් රු.125,882,490 ක් වැය කර තිබුණි.

(ii) මතුගම ශාන්ත මේරි විද්‍යාලීය පිහිනුම් තටාකය හා ක්‍රීඩාගාරය ඉදිකිරීම ව්‍යාපෘතිය අදියරයන් වශයෙන් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. නමුත් ව්‍යාපෘතියේ සමස්ථ පිරිවැය ඇස්තමේන්තුවක් හා ගොඩනැගිලි සැලැස්මක් සකස් කර නොතිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම 2009 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණ අතර 2015 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් වෙනුවෙන් රු.17,291,614 ක් වැය කර තිබුණි. පුහුණු අවශ්‍යතා මත මෙම පිහිනුම් තටාකය භාවිතා කිරීම ආරම්භ කර තිබුණද, 2016 මාර්තු මාසය වනවිටත් වැඩ නිම කර නොතිබුණි.

**(ආ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

**-----------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) යටියන බටහිර වොලිබෝල් පිටිය තනා නිම කිරීම**

**------------------------------------------------------**

2014 බටහිර රන් අරුණ ප්‍රාදේශීය සංවර්ධන වැඩ සටහන යටතේ අගලවත්ත ප්‍රාදේශීය ලේකම් විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අගලවත්ත ප්‍රාදේශීය සභාව වෙත භාර දී තිබුණි. කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු රු.465,157 කින් ඉටු කළ යුතු ඉදිකිරීම් සතුටුදායක ලෙස ඉටු කර තිබීම නිසා කොන්ත්‍රාත්තුවේ වටිනාකමෙන් සියයට 10 ක අතරුදවුම් මුදලක්ද, ගෙවා තිබුණි. නමුත් 2015 නොවැම්බර් 13 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී වොලිබෝල් ක්‍රීඩාව සඳහා කිසිසේත් සුදුසු නොවන මඩ වගුරක් වටා ජී අයි පයිප්ප යොදා ක්‍රීඩා පිටිය සකස් කර තිබුණි.

**(ii) හොරණගොඩ පාලම ඉදිකිරීම**

**--------------------------------**

2014 දොරින් දොරට ගමින් ගමට වැඩ සටහන යටතේ හොරණගොඩ පාලම ඉදිකිරීම සඳහා මතුගම ප්‍රාදේශීය ලේකම් විසින් පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය සමග ගිවිසුමකට එළඹ තිබුණි. ඒ සඳහා රු.4,376,639 ක් වැය කර තිබුණි. ව්‍යාපෘතිය පිළිබඳ පූර්ව විමර්ශන වාර්තාව අනුව මෙහි මූලික අරමුණ යටිතල පහසුකම් දියුණුකිරීම හා ප්‍රවාහන දුෂ්කරතා මග හැරීම වුවත්, පාලම අවසානයේ විශාල පුරන් කුඹුරක් නිරීක්ෂණය වු අතර පාලමෙන් එගොඩට යාම සඳහා පාරක්ද ඉදි කර නොතිබුණි.

**(iii) ගෝනලියද්ද හරහා කටුගහවත්ත අමුණ දක්වා ප්‍රතිසංස්කරණය කිරීම**

2014 වර්ෂයේ පළාත් නැගුම වැඩ සටහන යටතේ මතුගම ප්‍රාදේශීය ලේකම් විසින් රු.980,000 ක ඇස්තමේන්තුගත වටිනාකමකට එම කොන්ත්‍රාත්තුව ගොවි සංවිධානයකට පවරා තිබුණි. 2015 ඔක්තෝබර් මාසය වන විට රු.338,624 ක් වැයකර ව්‍යාපෘතිය අතර මග නවතා තිබුණි.

**(ඇ) ව්‍යාපෘතියේ වත්කම් ඌන උපයෝජිතව පැවතීම**

කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේ ආරම්භ කළ ඇතගම මාතෘ සායනය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.4,179,056 ක් වැය කර තිබුණි. 2016 මාර්තු මාසය වන විටත් සායනය විවෘත කර නොතිබුණි. සායනය සඳහා රු.552,544 ක් වූ උපකරණ 2014 දෙසැම්බර් මාසයේදී මිලදී ගෙන තිබුණද, ඒවා භාවිතයට නොගෙන ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ ගොඩ ගසා තිබුණි. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් සායනයට අත්‍යාවශ්‍ය උපකරණ නම්කර තිබියදී ඉහත පරිදි මුදල් වැයකර ඩීවීඩී යන්ත්‍ර, රූපවාහිනී, ලිප්, මේස හා කබඩ් මිලදී ගෙන තිබුණි.

## 3.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මෝදරවිල ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය රු.31,768,585 කට නිම කිරීමට 2014 නොවැම්බර් 10 දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් 2014 දෙසැම්බර් 02 දින රු.6,353,717 ක අත්තිකාරම් ගෙවා තිබුණත්, 2016 මාර්තු මාසය වන විටත් වසරකුත් මාස තුනක් ගතවී තිබුණද අත්තිකාරම් මුදලේ ප්‍රමාණයටවත් වැඩ ඉටු කර නොතිබුණි.

## 3.9 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහනවලට සිදු වූ අනතුරු 05කින් රු. 813,233 ක අලාභහානි සිදු වී තිබුණත්, ඒවා විසර්ජන ගිණුමේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) 1989 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු වී තිබුණු එකතුව රු.3,214,040 ක අලාභහානි 9 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර එම අලාභහානි අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ කපා හැරීමට අපොහොසත් වී තිබුණි.

## 3.10 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ආබාධිත තත්ත්වය පිළිබඳ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයේ අනුමැතිය නොමැතිව 1996 වර්ෂයේ සිට මාසිකව රු.18,656 ක් බැගින් විශ්‍රාමික නිලධාරියෙකුට අබාධිත විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි.

(ආ) ආබාධිත තත්ත්වය තහවුරු කර නොගෙන විශ්‍රාමික නිලධාරියෙකු වෙත 1991 මැයි මාසයේ සිට මාසයකට රු.16,502 ක් බැගින් ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි. එම විශ්‍රාමිකයා වෙනුවෙන් භාරකරුවෙකුද පත් කර නොතිබුණි.

(ඇ) බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 පෙබරවාරි 25 දින වන විට අවුරුදු 26 ඉක්මවූ අයෙකුට බාලවයස්කාර ගෙවීම් යටතේ 2015 ඔක්තෝබර් මාසය දක්වා එකතුව රු.186,138 ක් ගෙවා තිබුණි.

(ඈ) කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වනු ලබන විශ්‍රාමික ඉවත්වීමේ ලේඛනය සමග මියයන ලද විශ්‍රාමික ලේඛනය පරීක්ෂාවේදී, විශ්‍රාමික නිලධාරින් මියගිය බව ග්‍රාම නිලධාරින් විසින් දැනුම්දීමේ ප්‍රමාදය සහ ඉවත්වීමේ ලේඛනයේ සටහන් කිරීමේ ප්‍රමාදය නිසා එකතුව රු.205,797 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) අභ්‍යන්තර විගණන වාර්තාවේ දක්වා ඇති පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වාගෙන යන විශ්‍රාමික ඉවත්වීමේ ලේඛන හා මියයාම් සම්බන්ධ ග්‍රාම නිලධාරි දැනුම්දීමේ ලේඛන අනුව 2015 වර්ෂයේදී මියයාම් සටහන් කිරීම විධිමත් පරිදි සිදු කර නොතිබුණු බව අනාවරණය වී තිබුණි. ඒ අනුව බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් මියයන ලද විශ්‍රාමිකයන් 83 දෙනෙකුගෙන් 62 ක් පමණක්ද පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විශ්‍රාමිකයින් 278 කගෙන් 131 ක ගේ මියයාම් පමණක්ද ග්‍රාම නිලධාරි විසින් දැනුම් දී තිබුණි.

(ඊ) සුනාමියෙන් අවතැන් වූවන් නැවත පදිංචි කරවීම සඳහා නිවාස සෑදීම වෙනුවෙන් බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි රජයේ ඉඩම් ලබා ගැනීම සඳහා රු.41,873,341 ක් රජය විසින් වැය කර තිබුණි. නිවාස ඉදිකිරීමේදී පවතින නීතිමය විධිවිධාන පිළිබඳව සැලකිල්ලක් නොදක්වා එම නිවාස ඉදිකිරීම හේතුවෙන් එම නිවාසවල හිමිකම් ඔප්පු නිවැසියන්ට ලබාදීම 2016 මාර්තු මාසය වන විටත් නිම කර නොතිබුණි.

## 3.11 මානව සම්පත් කළමනාකරණය

(අ) **අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සේවක සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 68 | 64 | 04 |
| (ii) | තෘතීයික මට්ටම | 35 | 18 | 17 |
| (iii) | ද්විතියික මට්ටම | 1,964 | 1,713 | 251 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 170 | 162 | 08 |
| | **එකතුව** | **2,237** | **1,957** | **280** |